2020 නව විෂය නිර්දේශයට අනුකූලව සකස් කරන ලද

ශිෂ්‍යත්ව පෙරහුරු ප්‍රශ්න පත්‍ර

අංක 1 11 පත්‍රය පැය 1 මිනිත්තු 15යි

01.පහත කවිය ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

බටිති මලිති -කුරුලු පැටවු
සැම තැන - ඉගිළී
ජම්බු ගසේ -ඉදුණු ජම්බු
සොය සොයා- කතී
ලේන් පැටවු -ටිං ටිං ගා
එහෙ මෙහෙ-දුවතී
පේර ගසේ - ඉදුණු පේර
රසදැයි - බලතී
සමනලයෝ - රැන් රැන්
අත්තටු - සලතී
රෝස ගසේ - මල් පැණි බී
සිරිපා වඳිතී

i කවියේ සඳහන් පක්ෂීන් දෙදෙනෙක් ලියන්න.

............................ ............................

ii අප්‍රාණවාචී බහුවචන නාම පද දෙකක් ලියන්න ............................ ............................

iii බහුවචන ක්‍රියා පද දෙකක් ලියන්න ........... ......................

iv පැටවු යන්නේ ඇති පිලි නම් කරන්න.

........................... ...........................

v ලක්වැසියන්ගේ ගෞරවාදරයට පත් පූජනීය ස්ථානයක් මෙහි සඳහන්ය. එය කුමක්ද?.......................... (ල.10)

02. පහත ඉඟිවැකි වල අදහස , දී ඇති තිත් ඉර මත ලියන්න.

i එක හුස්මට....................................................

iiඅකුරක් නෑර ................................................... (ල.04)

03 .පහත ප්‍රස්තාව පිරුළු වල අඩු කොටස සම්පූර්ණ කරන්න.

i කටුස්සාගේ කරේ ...................................................

ii ..................................මිරිස් ගත්තා වගෙයි. (ල.04)

04.පහත තේරවිල්ල තෝරා ලියන්න.

i ගජනාලය ................................................... (ල.01)

05 .පහත වගන්තියේ ඉරි ඇඳි පදවලට විරුද්ධ පද අදාළ අංකය යටතේ ලියන්න.

''පාසල (i) ආරම්භයේ දී ම ළමුන් එකතු වී (ii) නොදිරන දෑ වෙන් කිරීමෙන් වත්ත (iii) පිළිවෙළට හා ලස්සනට තබා ගැන්ම (iv) සුදුසු වන අතර යහපත් ක්‍රියාවක් වන එයින් පාසල (v) පිරිසිදු වන බව කාගේත් මතයයි.''

i ........................... ii........................... iii ...........................
iv.......................... v.......................... (ල.05)

06.පහත වැකි අතීත කාලයට හරවා ලියන්න.

i මම ශාරීරික ව්‍යායාම් වල නිරත වෙමි.

.........................................................................

ii.නංගී අලුත් ගවුමකින් සැරසෙයි.

.................................................................... . (ල.04)

07.පහත දෙමළ වගන්ති සිංහල බසට හරවා ලියන්න.

i උංගල් නණ්බන් යාර්? ...............................................................

ii.නීංගල් යාර්? ................................................... ..(ල.04)

08.රූපයට අදාළ ඉංග්‍රීසි වචනයේ අඩු අකුර දී ඇති හිස්තැන මත ලියන්න





(ල.04)

i Spid---r ii. Cha---r

09. '' මා කැමති ම ක්‍රීඩාව '' මාතෘකාවට අදාළ ව වචන හතරකට නොඅඩු වැකි තුනක් ලියන්න. (අක්ෂර වින්‍යාසය හා උක්ත ආඛ්‍යාත සම්බන්ධය නිවැරදි විය යුතුය. )

i ................................................................................................

ii...............................................................................................

iii.............................................................................................

(ල.06)

**පහත ගැටලු විසඳන්න.**

(10) 4 , 6 , 0 ,8 ඉලක්කම් යොදා ලිවිය හැකි කුඩාම සංඛ්‍යාව අකුරෙන් ලියන්න..........................................................................

(11.) 17 ,26 , 35 ..........හිස්තැනට ආයුතු සංඛ්‍යාව ලියන්න.

(12) 4/10 මෙය දශම සංඛ්‍යාවක් ලෙස ලියන්න...........................

(13) ප.ව. 3.35 ට පැය බාගයකට පසු වේලාව සම්මත ආකාරයට ලියන්න..............................................................

(14) වත්තකින් පොල් ගෙඩි 4320 ක් කඩන ලදි .ඉන් ගෙඩි 1175ක් පොඩි ඒවා ලෙස වෙන් කර ඉතිරියෙන් 650 ක් විකුණූ පසු ඉතිරි කීයද?..................................................................

(15) අඹ ගෙඩි 120 න් හතරෙන් පංගු තුනක අඹ ගෙඩි කීයද?................................

(16)ත්‍රීරෝද රථ 75 සඳහා ගෙනෙන ලද රෝද වලින් 18ක දෝෂ තිබූ බැවින් ඉවත් කළේ නම් ඉතිරි කීයද?.................................

(17)  මෙහි ධාරිතාව 7l 625 ml වේ ඉන් 3 1/2 l ගත් පසු ඉතිරි කොපමණද?..................

(18)පෙ.ව. 7. 25 ට පිටත්වූ මව පැය 2 මිනිත්තු 35කට පසු නැවත ආවාය. මව පැමිණි වේලාව කීයද?...................................

(19)උතුර හා බටහිර අතර පිහිටන දිශාව කුමක්ද?..................

(20) නීතා 1m 08 cm උසය. ඇගේ නංගී ඇයට වඩා 15 cm උසින් අඩුය. නංගීගේ උස කොපමණද?...................................

 

1kg 350g 2kg 175g

(21) ගස්ලබු ගෙඩියට වඩා කොමඩු ගෙඩිය කොපමණ බරද?.....................................

(22) සීනි 1 kg ක මිල රුපියල් 120.00 නම් 2kg 500g ක මිල කීයද?.......................................................

(23)1983 වසර 20 වන සියවසට අයත් නම් 1973 අයත් වන්නේ කීවන සියවසට ද ?.....................................

(24)මෙලෙස දිස්වන ඝනවස්තුවේ නම කුමක්ද?................................ ( ල. 2×15=30)



**<u>ප්‍රශ්න අංක 25 සිට 55 දක්වා සියලු ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර දී ඇති පිළිතුරු අතරින් තෝරා යටින් ඉරක් අඳින්න.</u>**

25. ශ්‍රී ලංකා රාජ්‍ය ලාංඡනයෙහි දැකිය නොහැකි සංකේතයකි

i ඉර ii සඳ iii තරු

26. අවුරුද්දේ එක්තරා කාලයකට පමණක් පිපෙන මල් වර්ගයකි

i කෙසෙල් ii කිතුල් iii ඇහැල

27. පාංශු ජීවියෙක් වන අතර පස සාරවත් කිරීමට සහාය වන සතෙකි

i කුඹියා ii කැරපොත්තා iii ගැඩවිලා

28 . නියන , අත්කියත , යතුකැටය ,ආදි උපකරණ වැඩි වශයෙන් භාවිතා කරන වෘත්තිකයා වන්නේ

i පෙදරේරු කාර්මිකයා ii කම්මල් කාර්මිකයා iii වඩු කාර්මිකයා

29. ඇසුරුම් කළ භාණ්ඩයක් මිලදී ගැන්මේදී අප වඩාත් සැලකිලිමත් විය යුත්තේ

i නිෂ්පාදන ආයතනය ii අලෙවි කරන ආයතනය

iii භාණ්ඩයේ ප්‍රමිතිය

30. ලේන්සුවක් වටා මැසීමට සුදුසු මැහුම් ක්‍රමය වන්නේ

i දම්වැල් මැස්ම iiබ්ලැන්කට් මැස්ම iiiනැටි මැස්ම

31 . ආහාර කල් තබා ගන්නා ඉපැරණි ක්‍රමයක් නොවේ.

i දුම් ගැස්සවීම iiමී පැණි වල දැමීම iii ශීතකරණයේ තැබීම

32. අධික පැණිරස හා පිෂ්ටය සහිත ආහාර වැඩි වශයෙන් ගැනීම නිසා හට ගත හැකි රෝගය

iදියවැඩියාව iiගැස්ටයිටීස් iii අධිරුධිර පීඩනය

33. ස්වභාවික හේතූන් නිසා විය හැකි අනතුරක් නොවන්නේ

i සුළි සුළං ii සුනාමි iii විදුලි සැර වැදීම

34. මදුරුවන් මගින් බෝවන රෝගයක් වන්නේ

iසරම්ප iiපාචනය iii බරවා

35 .බීජ හා දඬු මගින් පැළ කර ගත හැකි බෝගයක් වන්නේ

i බණ්ඩක්කා iiවම්බටු iii නිවිති

36.පහත ප්‍රකාශ අතරින් වඩාත් නිවැරදි ප්‍රකාශය වන්නේ

i ජලය ළා නිල් පැහැති වර්ණයකින් යුක්තය.

ii ජලය ට කිසිදු හැඩයක් නොමැත.

iii ජලය නිශ්චිත වූ හැඩයකින් යුක්ත වේ.

37. පාර මාරු වීමේදී අප විසින් නොකළ යුතු දෙයකි

iජංගම දුරකථනය අතේ තබා ගෙන යාම.

ii ඉතාමත් හෙමින් ගමන් කිරීම.

iii අන් අය හා කතා නොකරමින් පාර මාරු වීම.

38. කාබනික පොහොර භාවිතයෙන් අපට අත් වන වාසියකි

i වසවිසෙන් තොර ආහාර ගැනීමට හැකි වීම.

ii අපට ඉක්මනින්ම සකස් කර ගතහැකි වීම .

iii පාංශු ජීවීන් විනාශ වීම.



39 .මෙම රූපයෙන් දිස්වන්නේ

i නිවිති ii කංකුං iiගොටුකොළ

40.අප රටේ ජාතික පක්ෂියා වන්නේ

iසුදු පරෙවියා ii කොහා iii වලිකුකුළා

41 පලා වර්ග ආහාරයට ගැනීමේ දී අප නොකළ යුතු දෙයකි

i හැකි සෑම විටම අමුවෙන් ගත හැකි පලාවර්ග අමුවෙන් ගැනීම

ii පලා වර්ග කැපීමට පෙර හොඳින් සේදීම

iii පලා වර්ග බොහෝ වේලාවක් පිස ගැනීම

42 මෙම උපකරණය වන්නේ 

i අඬුව ii ස්පැනරය iii ගිරය

43 චුම්බකයක ආකර්ශන ශක්තිය වැඩි වශයෙන් ඇත්තේ

i එහි මැද කොටසේය ii දකුණු කෙළවරේය iii එහි දෙකෙළවරය

44 අප අන් අය හා සහනශීලීව කටයුතු නොකිරීමෙන්

i ගැටුම් වැළකී යයි ii හොඳ හිත දිගටම පවත්වා ගෙන යා හැකිය

iii සමාජයෙන් කොන් වී යයි

45 අප රටේ දිස්ත්‍රික්ක වැඩි වශයෙන් අයත් පළාත වන්නේ

i උතුරු ii දකුණු iii නැගෙනහිර

46 තම්බා බීමට ගන්නා මල් වර්ගයක් වන්නේ

i මුරුංගා ii සියඹලා iii රණවරා

47 අප රටේ ඓතිහාසික වටිනාකමකින් යුත් ශාකයක් නොවේ

iඕපනායක යෝධ පුස්වැල ii මිහින්තලේ අඹ ගස

iii මන්නාරමේ බඹිබැබි ගස

48 සන්නිවේදනයේ අංගයක් නොවේ

i යවන්නා ii මාධ්‍යය iii අලංකාරය

49 **අහසින් වැටෙන එක ජල බිඳුවක් හෝ අපතේ නොයවා ප්‍රයෝජනයට ගත යුතු යි** යනුවෙන් ප්‍රකාශ කළේ

i දුටුගැමුණු රජුය ii මහා විජයබාහු රජුය

iii මහා පරාක්‍රමබාහු රජුය

50 පොදු වාහන භාවිතයේදී අප නොකළ යුතු දෙයකි

i පොදු උපදෙස් පිළිපැදීම ii ආසන ඉරාදැමීමෙන් වැළකීම

iii ආසන වල නම් ලිවීම

51 අප රටේ කීර්ති නාමය නැංවීමට දායක වූ අයෙක් නොවේ

i ආචාර්ය ටී.බී. ජයා මහතා ii මහත්මා ගාන්ධි තුමා

iii ඩබ්ලිව් ඩී.අමරදේව මහතා

52 පුද්ගලයෙකුට තම මුහුණෙන් පෙන්විය නොහැකි හැඟීමකි

i සතුට ii කරුණාව iii පිළිකුල

53 අතීතයේ භාවිතා කළ සන්නිවේදන උපක්‍රමයක් නොවේ

i ගිනි ගොඩක් ගැසීම ii අණබෙර iii ඊ මේල් යැවීම

54. අප රට යටත් කරගෙන සිටි විදේශීය ජාතියක් නොවේ

i ඉංග්‍රීසි ii ලන්දේසි iii ස්පාඤ්ඤ

( ල. 1×30 =30)

සැකසුම: සන්ධ්‍යා සමරසිංහ මිය 5-B ශ්‍රේණිය, අනුලා විද්‍යාලය